# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,420 - 2025 ජනවාරි මස 17 වැනි සිකුරාදා - 2025.01.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... | 38 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් | |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 පෙබරවාරි 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජනවාරි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම ගැසට් පත්‍රය *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් සභා නිවේදන

## වයඹ පළාත් සභාව

1946 අංක 57 දරන පොදු සුසාන හා පෞද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥාපනතේ II පරිච්ඡේදයේ 5 (i) යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (i) උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1946 අංක 57 දරන පොදු සුසාන භූමි හා පෞද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥාපනතේ II පරිච්ඡේදයේ 5 (i) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාතේ පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරවර තිස්ස කුමාරසිරි වර්ණසූරිය වන මා විසින් වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයෙහි සඳහන් සුසාන භූමි මළවුන් වැළලීම හෝ ආදාහනය කිරීම පිණිස පොදු සුසාන භූමි ලෙසින් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

තිස්ස කුමාරසිරි වර්ණසූරිය,
ගරු ආණ්ඩුකාරවර.
වයඹ පළාත.

2024 දෙසැම්බර් මස 10 වැනි දින,
කුරුණෑගල ආණ්ඩුකාරවර කාර්යාලය.

### උපලේඛනය

01. අලියාවැටුණුවැව සුසාන භූමිය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 32 අලියාවැටුණුවැව ග්‍රාම නිලධාරි වසමේ අලියාවැටුණුවැව ගමෙහි පිහිටියා වූ අ.ග.පි. 3692 දරන පිඹුරෙහි කැබලි අංක 96න් හෙක්ටයාර් 0.620ක් විශාල වූ උතුරට : කැබලි අංක 95 ද, නැගෙනහිරට : කැබලි අංක 95 ද, දකුණට : කැබලි අංක 95 සහ 97 ද, බටහිරට : කැබලි අංක 97 ද වන පලුගහයාය නම් වූ රජයේ ඉඩම.

02. ගම්පොල සුසාන භූමිය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 33 ගම්පොල ග්‍රාම නිලධාරි වසමේ ගම්පොල ගමෙහි පිහිටියා වූ ටො. පො. පි. පි. 30 දරන පිඹුරෙහි කැබලි අංක 134න් හෙක්ටයාර් 0.469ක් විශාල වූ උතුරට කැබලි අංක 138 ද, නැගෙනහිරට : කැබලි අංක 138, 137 ද, දකුණට : කැබලි අංක 137 සහ 135 ද, බටහිරට : කැබලි අංක 135 ද වන ඇහැටුගහහේන නම් රජයේ ඉඩම.

01-185

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.